# ජාතික අධ්‍යාපන ආයතනය

# ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව 2025

# ජාතික ශික්ෂණ විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීම (සිංහල මාධ්‍ය)

**SLQF Level 6**

ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වන අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව සඳහා ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. පාඨමාලාවේ ස්වභාවය

1.1 අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව සම්භාර 120කින් යුක්තය. (ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් සඳහා පාඨමාලා සම්භාර 60ක් නිදහස් කෙරේ)

1.2 මෙම පාඨමාලාව සති අන්ත සහ පාසල් නිවාඩු කාලවල දී පැවැත්වේ. ජාතික අධ්‍යාපන ආයතනයේ සහ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල දී මාර්ගගත හා සම්මුඛ සැසි මගින් අධ්‍යයන කටයුතු ක්‍රියාත්මක කෙරේ.

1.3 සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව පවත්වන අතර, ඉංග්‍රීසි භාෂාව උගන්වන ගුරුභවතුන් වෙනුවෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව පැවැත්වේ.

## 2. අයදුම් කිරීම සඳහා ප්‍රවේශ සුදුසුකම්

2.1 අ.පො.ස (උ.පෙළ) සමත් වීම සහ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව(ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ) සමත්වීම.

2.2 2024.12.10 දින හෝ එදිනට පෙර ශ්‍රී ලංකා ගුරු සේවයේ/ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයේ/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථිර පත්වීමක් ලබා, අඛණ්ඩව සේවයේ නිරතව සිටීම.

## 3. තෝරා ගැනීම

3.1 සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පාඨමාලාලාභීන් තෝරා ගනු ලැබේ. මෙහි දී සේවා කාලය සඳහා ප්‍රමුඛතාව දෙනු ලැබේ.

3.2 පාඨමාලාවක් සඳහා සුදුසුකම් ලැබූ පාඨමාලාලාභීන් අවම වශයෙන් 50දෙනෙකුවත් එක් මධ්‍යස්ථානයක සිටිය යුතු ය. එසේ නොමැති අවස්ථාවල දී ජාතික අධ්‍යාපන ආයතනය තීරණය කරන මධ්‍යස්ථානයක එම පාඨමාලාව ක්‍රියාත්මක කරනු ලැබේ. මේ පිළිබඳ අවසාන තීරණය අධ්‍යක්ෂ ජනරාල් සතු ය.

## 4. පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථාන

අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන් පැවැත්වෙන මධ්‍යස්ථාන පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | උපාධි පාඨමාලාව | මධ්‍යස්ථානය |
|---|---|---|
| 1 | විද්‍යාව පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |
| 2 | ගණිතය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |
| 3 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |
| 4 | කෘෂිකර්මය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |
| 5 | ගෘහ ආර්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |
| 6 | ශිල්ප කලා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |
| 7 | ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම, අනුරාධපුර, බදුල්ල, බිංගිරිය, කුරුණෑගල, මාතර, පේරාදෙණිය, පොල්ගොල්ල, පොලොන්නරුව, රත්නපුර |
| 8 | සමාජ විද්‍යාව පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම, අනුරාධපුර, බදුල්ල, බිංගිරිය, කුරුණෑගල, මාතර, පේරාදෙණිය, පොල්ගොල්ල, පොලොන්නරුව, රත්නපුර |
| 9 | වාණිජ්‍යය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |
| 10 | සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |
| 11 | දෙවන බස දෙමළ පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |
| 12 | විශේෂ අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |
| 13 | දෙවන බස සිංහල පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |
| 14 | සංගීතය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මීපේ |
| 15 | නර්තනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මීපේ |
| 16 | නාට්‍ය හා රංග කලාව පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මීපේ |
| 17 | චිත්‍ර කලාව පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මීපේ |
| 18 | පළමු බස සිංහල පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම/අනුරාධපුරය |
| 19 | බුද්ධ ධර්මය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |
| 20 | කතෝලික ධර්මය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය | මහරගම |

## 5. ගාස්තු අය කිරීම

| | |
|---|---|
| අයදුම්පත්‍ර ගාස්තුව | රු: 1,500/= |
| ලියාපදිංචි ගාස්තුව | රු: 2,000/= |
| එක් සෙමෙස්තරයක් සඳහා රු: 50,000/= බැගින් සෙමෙස්තර 4ක් සඳහා | රු: 200,000/= |

සම්පූර්ණ පාඨමාලා ගාස්තු සමාන වාරික හතරකින් ගෙවිය හැකි ය. විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේ දී අදාළ විභාග ගාස්තු ගෙවිය යුතු ය. ගාස්තු සංශෝධනය කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවට බලය තිබේ.

**6. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

6.1 ජාතික අධ්‍යාපන ආයතනයේ, ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් **www.teachereducation.lk** පාඨමාලාවට අයදුම්පත් කැඳවීම සම්බන්ධ තොරතුරු ලබා හැකි ය.

6.2 ඉහත දැක්වෙන ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ Google Form Link ඔස්සේ අයදුම් කළ යුතු ය.

6.3 ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයේ පිටපතක් ඔබගේ විද්‍යුත් තැපෑලට යොමු වන අතර, එම අයදුම් පත්‍රයේ මුද්‍රිත පිටපත ඔබගේ පාසලේ විදුහල්පතිගේ සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය සහිතව රුː 1500/-ක අයදුම්පත් ගාස්තුව ගෙවන ලද බැංකු කුවිතාන්සිය සමඟ සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන අවස්ථාවේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට භාර දිය යුතු ය.

**7. අයදුම්පත් ගාස්තුව ගෙවන ආකාරය**

ඕනෑම ලංකා බැංකු ශාඛාවක තිබෙන ජාතික අධ්‍යාපන ආයතනයේ, මුදල් තැන්පතු පත්‍රිකාවේ ගෙවීම් කේතය (**Payment Reference Number)** ලෙස **BE25A00000A1** සඳහන් කර රු. 1500/-ක් ගෙවා කුවිතාන්සිය ලබා ගත යුතු ය. මෙම ගාස්තුව නැවත ප්‍රතිපූරණය කරනු නොලැබේ.

**8. සම්මුඛ පරීක්ෂණයට කැඳවීම**

සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා වන ලිපිය ඔබගේ විද්‍යුත් තැපෑලට පමණක් යොමු කරනු ලැබේ.

**අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2024.12.10**

**9. විමසුම**

වැඩිදුර විස්තර සඳහා 0117 601 743, 0117 601 736, 0117 601 803 යන දුරකථන අංකවලට සතියේ දිනවල ප.ව. 2.00 සිට ප.ව. 4.00 දක්වා ඇමතීමෙන් ලබා ගත හැකි ය.

**මහාචාර්ය ප්‍රසාද් සේතුංග**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය